# ආලකමන්දා සංකල්පය සහ සීගිරිය

ගුණවර්ධන නානායක්කාර

සීගිරි පර්වතය, රජ මාළිගාව, බිතුසිතුවම් සහ කැටපත් පවුරේ කුරුටු ගී ගැන වියතුන් විවිධ මත පළ කොට තිබේ. විස්මිත නිර්මාණ ලෙස බොහෝ දෙනා විසින් පිළිගෙන ඇති මෙය 1 වන කාශ්‍යප රජු විසින් කරවන ලද්දකි. කාශ්‍යප රජු මුගලන් කුමරුන්ගෙන් විපතක් සිදුවේ යැයි බියට පත් ව ඉතා දුෂ්කර වූ සීගිරියට ගිය බව මහාවංශය පවසයි. මිනිසුන්ට නැගීමට ඉතා දුෂ්කර වූ ඒ පර්වතය අවට පවිත්‍ර කොට පවුරු බඳවා පියගැට පෙළ සාදවා එහි පාමුල සිංහ රූපාකාර දොරටු විශේෂයක් නිම කළ බැවින් සීගිරිය යන නාම භාවිතයට එක් වූ බව ද, වස්තුව එක්රැස් කොට එහි සුරක්ෂිත ව තබා නෙත් සිත් බඳනා රජ මැදුරක් සහ දෙවෙනි ආලකමන්දාවක් සේ නිමවා කාශ්‍යප රජු එහි කුවේරයකු මෙන් වාසය කළ බව ද මහාවංශය සඳහන් කරයි.

රාජකීය ආසියාතික සමිතියට පුරාවිද්‍යා අධිකාරිය විසින් සපයන ලද ලිපියකින් ඒ බව තහවුරු කොට කරුණු දක්වා ඇත. ලංකාවේ පමණක් නොව ඉන්දියානු සභ්‍යත්වයේ ආභාසය ලද බොහෝ රටවල නොයෙක් අවධිවල දී රජවරුන් සිය තේජස, ප්‍රතාපවත් බව හුවා දැක්වීමට දේවත්වය ආරූඪ කරගත් බව එම ලිපියෙන් ප්‍රකාශ වේ. මේ මතය ලංකාවේ ද ප්‍රචලිත වීමෙන් ඒ හා සම්බන්ධ සංකල්පය තමා වෙත ආරූඪ කරගන්නට කාශ්‍යප රජු උත්සුක වූවා විය හැක.

> 'භාරතීය ශිෂ්ටාචාරය වැළඳගත් විවිධ ප්‍රදේශවල විවිධ අවස්ථාවල දී පවා දෙවියකුගේ අවතාරයක් බවට පත්කර ගැනීමෙන් රජුට තමාගේ ආනුභාවයත්, බලයත් මහත්වයට පත්කර ගත හැකිය යන විශ්වාසය පැවතිණි. ඇතැම් අවස්ථාවල මෙය කරන ලද්දේ රජු උස් කන්දක් උඩ

---

© ගුණවර්ධන නානායක්කාර
සංස්. පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි. ආර්. එම්. ඩබ්. රාජපක්ෂ, ඉන්ද්‍රා දසනායක, ජොසෆින්ලා රත්නෑ
මානව ශාස්ත්‍ර පීඨ සංග්‍රහය, 5 කලාපය, 2008, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය